**ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය - 2019**

**--------------------------------------------------------**

ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2006 දෙසැම්බර් 14 දින එළඹි අංක එස්ආර්අයි -2217 දරන ණය ගිවිසුමේ 6 උපලේඛනයේ 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය,වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. මාර්ග අංශයේ ආයතන වැඩිදියුණු කිරීම සහ නියමු කාර්යසාධනය පදනම් කරගත් නඩත්තු කොන්ත්‍රාත් සංවර්ධනය කිරීම තුළින් ජාතික මහාමාර්ග ජාලයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම හා මාර්ග අංශයේ ආයතන සවිබල ගැන්වීම ව්‍යාපෘතියේ අරමුණ වේ.ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 21,655 කට සමාන එ.ජ.ඩො. මිලියන 208 ක් වූ අතර ඉන් රු. මිලියන 15,275 කට සමාන එ.ජ.ඩො මිලියන 150 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි.ඉතිරි ඩොලර් මිලියන 58 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. 2008 පෙබරවාරි 14 වන දින ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර ඒ අනුව මුල් ණය මුදල ඇතුළත ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කිරීම සඳහා 2008 මැයි 27 දින ණය ගිවිසුම සංශෝධනය කර ඇත. ඉහත ණය මුදලට අමතරව, අංක 1355 පී දරණ තවත් ණය ගිවිසුමක් ශ්‍රී ලංකා රජය විසින් ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල සමඟ 2010 ඔක්තෝබර් 04 දින අත්සන් කර තිබුණු අතර රු. මිලියන 880 කට සමාන එ.ජ.ඩො මිලියන 8ක් වෙන් කිරීමට ඔපෙක් අරමුදල විසින් එකඟවී තිබුණි.ඇමෙරිකන් ඩොලර් මිලියන 85 කට සමාන රුපියල් මිලියන 9350 ක් වෙන් කිරීම සඳහා අංක 2767 - එස්ආර්අයි දරණ අමතර ගිවිසුමක් ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ 2011 ඔක්තෝබර් 04 දින අත්සන් තබන ලදි.පරිපූරක ණය ගිවිසුම යටතේ කරන ලද ප්‍රතිපාදන 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය තුළ වෙන වෙනම ඉදිරිපත් කර ඇත.මුල් ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ කටයුතු 2006 අප්‍රේල් 07 දින ආරම්භ කරන ලද අතර 2012 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලසුම්කර තිබුණි.කෙසේවෙතත් මහාමාර්ග ලේකම් ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම ප්‍රමාද වීම නිසා ව්‍යාපෘතියේ කාලය 2016 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල විසින් මූල්‍යන ක්‍රියාකාරකම් 2015 ජූනි 30 දින අවසන් කරන ලදි.

## 1.3 මතය

**-------**

මාගේ වාර්තාවේ 2 වන වගුවේ විස්තර කරන ලද කරුණුවල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂ සඳහා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම ,මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරිම සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී,ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව ඇගයීම කළමනාකරණයේ වගකීමක් වන අතර, ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවයන් සතු වේ.

ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකි වන අයුරින් එහි සියලුම ආදායම්,වියදම්,වත්කම් සහ වගකීම් සම්බන්ධ විධිමත් පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනිවො හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම

ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම,ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමග මම සන්නිවේදනය කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

-----------------------------------

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් වැඩ 2016 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණා වුවත්, ව්‍යාපෘතියේ වත්කම් අදාල ක්‍රියාත්මක කරන ආයතනය වෙත භාර දීමට සහ 2019 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමේ අරමුණැති මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමට අවශ්‍ය උපදෙස් ක්‍රියාත්මක කරවන ආයතනය විසින් නිකුත් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ මෙහෙයුම් අවසන් කිරීමට ගතවන කාලය දීර්ඝ වීමේ හැකියාවක් පැවතීම. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනයට වත්කම් භාර දී ඇති අතර භාරදුන් වත්කම් වර්තමානයේ පවතින ස්ථානය හඳුනා ගැනීමේ ක්‍රියාවලිය (කාර්යාල ලී බඩු සහ උපකරණ) ක්‍රියාත්මක වෙමින් පවතී.ගෙවිය යුතු බිල්පත් පියවන තෙක් අවසන් කිරීමේ ගිණුම් පිළියෙල කර නොමැති අතර 2020 වර්ෂයේ අවසන් කිරීමේ ගිණුම් පිළියෙල කිරීමට බලාපොරොත්තු වේ. | ව්‍යාපෘතිය සඳහා අවසන් කිරීමේ ගිණුම් පිළියෙල කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |

## 03. භෞතික කාර්යසාධනය

--------------------------------

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

-------------------------------------------------------

ලැබී ඇති තොරතුරුවලට ව්‍යාපෘතියේ මෙහෙයුම් සැලැස්මට අනුව ජාතික මාර්ග 9 ක කි.මී.279 ක් අවසන් කිරිමට ලේඛණ ගත කර තිබුණු අතර එයින් ජාතික මාර්ග 05 ක කි.මී.244 ක් වැඩිදියුණු කිරිම හා පුනරුත්ථාපනය කිරිමේ වැඩ ව්‍යාපෘතිය විසින් අවසන් කර 2016 දෙසැම්බර් 31 වන විට ක්‍රියාත්මක කරන ආයතනයට භාර දී තිබුණි. ඊට අමතරව, මහාමාර්ග ලේකම් ගොඩනැගිල්ලේ ඉදිකිරිම් වැඩ ව්‍යාපෘතිය විසින් රු. මිලියන 2938 ක පිරිවැයක් දරා අවසන් කර තිබුණු අතර, 2016 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. කෙසේ වෙතත් ලී බඩු , ගොඩනැගිල්ලේ සවිකිරිම් හා අනෙකුත්උපකරණ 2019 දෙසැම්බර් 31 වන විටත් භාර දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, 2019 දෙසැම්බර් 31 වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගොඩනැගිල්ල සඳහා අනුකූලතා සහතිකයක් ව්‍යාපෘතිය වෙත නිකුත් කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------------

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ලබා ගැනීමට හැකි වූ තොරතුරු අනුව ව්‍යාපෘතිය විසින් 2019 දෙසැම්බර් 31 දක්වා අත්පත් කර ගත් ඉඩම් කැබලි 4422 ට රු.මිලියන 1,163.13 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2019 දෙසැම්බර් 31 වන විටත් ඉඩම් කැබලි වල හිමිකාරිත්වය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට සහ ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එම නිසා වන්දි සහ පොලී ගෙවීම් මත පිරිවැය ඉහල යාමට හැකිය. | ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය නිකුත් කිරීම සඳහා පොළිය ඇතුළුව වන්දි මුදල් ගෙවිය යුතු වේ. අප මේ වන විටත් යම් යම් මාර්ග කොටස් සඳහා 44 වගන්තිය නිකුත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර, සම්පූර්ණ ගෙවීම් සඳහා අරමුදල් හා ප්‍රතිපාදනයන් අපේක්ෂාවෙන් සිටී. | වත්කම්වල හිමිකම පැවරීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |